# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2013 අප්‍රේල් මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2013. 04. 16 දින නිකුත් කරන ලදී)**

## පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන)

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතියේ බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වන වගන්තිය (මෙහි මින්මතු —ප්‍රධාන ප්‍රඥප්තිය˜ යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රවාහනයට බලපත්‍රයක් අවශ්‍ය වන්නා වූ ඉදිකිරීම් කාර්ය සඳහා අවශ්‍ය වන ඛනිජ ද්‍රව්‍ය කලින් කල නියම කිරීමට අමාත්‍යවරයාට හැකියාව ලබාදීමට විධිවිධාන සැලැස්වීමයි.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රයක් ලබා ගැනීමට අමාත්‍යවරයාගේ අවසරය අවශ්‍ය වන ආරක්ෂිත ඛනිජ ද්‍රව්‍ය නියම කිරීමයි.

***4 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අමාත්‍යවරයාට නියමයන් සෑදිය හැකි කාරණා අන්තර්ගත අලුත් ඡේද දෙකක් ඇතුළත් කිරීමයි.

# පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන)

එල්.ඩී.ඕ. — 18/2012

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක      දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1992 අංක 33 දරන පනතේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තියක් එකතු කිරීම මගින් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

> "(5) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන්නා වූ ඉදිකිරීම් කාර්ය සඳහා අවශ්‍යවන ඛනිජ ද්‍රව්‍ය අමාත්‍යවරයා විසින්, කාර්යාංශයේ ලිඛිත අනුමතය සහිතව කලින් කල නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "විකිරණශීලී මූලද්‍රව්‍ය අන්තර්ගත යම් ඛණිජ ද්‍රව්‍ය සහ හිරිගල්" යන වචන වෙනුවට "විකිරණශීලී මූලද්‍රව්‍ය අන්තර්ගත යම් ඛනිජ ද්‍රව්‍ය , ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන්, ගානට්, හිරිගල්" යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: —

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) (ක) ඡේදයේ "අනුකූලව ක්‍රියාකිරීමේ ආකාරය." යන වචන වෙනුවට "අනුකූලව ක්‍රියාකිරීමේ ආකාරය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

2- PL 007136 — 485 (2013/03)

(ආ) එම උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

"(ග) ඉදිකිරීම් කාර්ය සඳහා අවශ්‍ය ඛනිජ ද්‍රව්‍ය නියම කිරීම ; සහ

(ච) බලපත්‍රයක් අවශ්‍යවන ඛනිජ ද්‍රව්‍යවල ධාරිතාව, ප්‍රවාහනය කරන මාර්ගය සහ ක්‍රමවේදය .".

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය .

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.